

ජගත් ජේ එදිරිසිංහ

# තාරකා විජිතය 2

1



අනුරාධ පඩිපෙළ බැස මිදුලේ උද්‍යානයේ කෙළවරක පනවා තිබූ අසුනක වාඩි වූයේ ය. මෙතැනට ශ්‍රෙගරි වැව අපූරුවට පෙනෙයි. ඇසි පිය නොහෙලා ඒ දෙස බලා සිට ඒ සුන්දරත්වය විඳගන්නට ඔහු උත්සාහ කළේ ය. බෙහෝ ඈත කාල වකවානුවක අහිමිව ගිය ආදරයක මතකය සිත කොනහමින් වද දෙනු ඔහුට දැනුණි. තනි වන සෑම මොහොතක් පාසාම සිතට දැනෙන ඒ වේදනාවේ නිමාවක් නොමැති සේ ය.

උසුලාගත නොහැකි බරක් සේ වරෙක දැනෙන රසික ආකර්ශණය හා ජන ප්‍රසාදය මැද තමා මේ තරම් හුදකලා වූයේ මන්දැයි

"සර් .. බියර් එක.. "

අනුරාධ බියර් බෝතලයක් වීදුරුවක් සහ කටගැස්මක් බන්දේසියක තබාගත් වේටර් තරුණයා දෙස බැළුවේ අප්‍රසාදයෙනි.

"ඔහෙන් තියන්න..." ඔහු නොසැලකිළිමත් ලෙස කීවේ ය.

බන්දේසිය අනුරාධ ඉදිරියෙන් තැබූ තරුණයා යමක් අසන්නට මෙන් තවමත් බලා සිටියි. අනුරාධ ඔහු දෙස බැලුවේ ඉක්මනින් ඔහු මෙතැනින් පිටත්ව යනු දැකීමේ රිසියෙනි.

"සර්... " තරුණයා යමක් කියන්නට තතනයි.

"ඔව්.. "

"සර් මගේ නම කුමාර.. සර්.."

"ඔව් කුමාර කියන්න.. "

"සර්.. මං රඟපාන්න හරිම ආසයි සර්.... මටත් ෆිල්ම් එකේ පොඩි කෑල්ලක් අල්ලලා දෙන්න බැරි ද?"

අනුරාධට මේ ඉල්ලීම අරුමයක් නොවී ය. මේ යන යන තැන දී සිය දහස් වාරයක් ඔහු අසා ඇති ඉල්ලීමකි. ඒ ඉල්ලීමට දෙන පිළිතුරද ඔහුට කටපාඩම් ය.

"බලමු.. " ඔහු සුපුරුදු පිළිතුර ම දුන්නේ ය. එය කිසිදු වටිනාකමක් නැති හුදු පිලිතුරක් පමණක්ම බව ඔහු දැන සිටියේ ය.

තමාගේ පිලිතුරෙන් පසු තරුණයා ඉවත්ව යනු ඇතැයි අනුරාධ බලාපොරාත්තු වූයේ ය.

"හැමෝම එහෙම තමයි සර් කියන්නෙ... " කුමාරගේ කටහඬෙහි වූයේ බලාපොරොත්තු කඩ වූ ස්වරයකි. විදුරුවට බීර වත්කර ගන්නා අතර හිස ඔසවා තරුණයා දෙස බැලූ අනුරාධට තමාගේ නොසැළකිළිමත් පිළිතුර පිලිබඳව කණගාටු සිතුණි.

"අපි හෙට ෂුටිං කරන්නෙ බිලැක් පූල් වල.. කුමාර එතෙන්ට එන්න.. මං උදව්වක් කරන්නං.." අනුරාධ කීවේ ය.

"බොරු නෙවයි නේද සර්.. "

"පිස්සුද මනුස්සයෝ.. ඇත්තටමයි කිව්වෙ.. "

"තැන්කිව් සර් තැන්කිව්... නුවරඑළියට ෂූටිං ඇවිත් මේ හෝටලේට කවතින්න එන හැමෝගෙන්ම සර් විතරයි මට ඔහොම කිව්වෙ... මං හෙට දවසම නිවාඩු දාලා එන්නං සර්.. "

අනුරාධ සිනාසුණේ ය.

හිස් බන්දේසියත් රැගෙන එක පිම්මේ දුවගිය කුමාර නැවතුණේ පිලිගැනීමේ කවුන්ටරයේ සිටි සඳමාලි ඉදිරියේ ය.

"මොකද ළමයෝ මේ කඩි කුලප්පුවෙන් වගේ... ?"

"මිස් දන්නවද..? මං හෙට ෆිල්ම් එකේ ඇක්ට් කරනවා... "
"වැඩේමයි... "
"බොරු නෙවෙයි ඇත්තමයි කිව්වෙ... අනුරාධ අයියා කිව්වෙ... හෙට මං නිවාඩු දාලා යනවා... "

"නිකම් කියන්න ඇති ළමයෝ.. ඔච්චර හෝප්ස් තියාගන්න එපා..."

"නෑ.. නෑ.. මේ පාර නම් ෂුවර්.. අනුරාධ අයියා බොරු කියන කෙනෙක් නෙවෙයි.."

"මොකක්ද දෙනවා කිව්ව රෝල් එක..?"
"කොල්ලගෙ සපෝටර් .."
"මොකක්...?"
"දන්නැද්ද..? කොල්ලගෙයි කෙල්ලගෙයි ලව් එකට සපෝට් කරන යාලුවා... "

"පිස්සා.." සඳමාලි බන්දේසියත් අතැතකිව හෝටලට තුළට දුව යන්නට හැරුණ කුමාර දෙස බලා සිනාසුණා ය. "..දුවන්නෙ නැතිව අර අතන ටී වී එක ඉස්සරහ වාඩි වෙලා

*"... බැය්ද මටත් ඔය ෆිල්ම් ඒකේ රඟපාන්න ඉඩක් හොයාදෙන්න..? "*
*අනතුරුව ඇය ඇසුවා ය.*

ඉන්න මිස් ගාව තියෙන හිස් භාජන විට අරන් යන්න..."

නිෂාධි රූපවාහිණී යන්ත්‍රය දෙස බලා සිටියේ කිසිදු අරමුණකින් තොරව ය. ටෙලි නාට්‍යය අවසන් වූ තැන සිට ඈ නොදැනුවත්වම කල්පනා කරමින් සිටියේ අනුරාධ පිළිබඳව ය. ඒ ඉතාම කෙටි හමුවීම ඇගේ සිතේ නොමැකෙන ලෙස සටහන්ව තිබුණේ දිග කතාවක කුඩා පරිච්ඡේදයක් ලෙසින් ය. ඒ ප්‍රසන්න තරුණයා තවත් වතාවක් හමුවුණොත් යන අපේක්ෂාව විදිලියක් සේ ඇගේ සිත හරහා ඇදී ගියේ ය. ඒ නොදැමුණ සිතිවිල්ල සිතෙන් ඉවත්කර ගත නොහැකි බවක් ඇයට දැනුණි.

"එක්ස්කියුස් මී මිස් ... මේවා අරගන්න ද..?" හිස් බඳුන් ඉවත් කරන්නට පැමිණි වේටර් තරුණයා නිෂාධිගේ දැහැණ බිඳ දැම්මේ අනුකම්පා විරහිතව ය. ඇය හිස සලා අනුමැතිය දුන්නා ය.

"මිස් දන්නවද වැඩක්..? මං හෙට ෆිල්ම් එකක ඇක්ට් කරනවා.." කුමාර කෝප්පය බන්දේසිය මත තබා ගන්නා අතර කීවේ ය.

නිෂාධි සිනාසුණා ය.

"හරි ෂෝක් නෙ..."

"ෂෝක් තමයි මිස්... මං අවුරුදු ගාණක් තිස්සෙ බලා හිටිය දෙයක්.. ඔන්න අද තමයි මිස් චාන්ස් එක ආවෙ... හෙට තමයි ෂූටිං... බිලැක් පූල් පැත්තෙ ... නියම ඉස්ටෝරිය..."

"මෝඩ කොල්ලෙක්..." නිෂාධි සිතුවා ය. මේ කටකාරයා අමාරුවේ දැමිය යුතු යයි ඇය මොහොතකට සිතුවා ය. ".. බැය්ද මටත් ඔය ෆිල්ම් ඒකේ රඟපාන්න ඉඩක් හොයා-දෙන්න..?" අනතුරුව ඇය ඇසුවා ය.

"මිස් ඇත්තටමද ඇහුවෙ...?"

"ඇත්තටම තමයි.. පුලුවන්ද..?" නිෂාධි ඇසුවේ තරුණයා අමාරුවේ දැමීම පිළිබඳව සිතින් සිනාසෙමිණි.